# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1960/69 - 2016 අප්‍රේල් මස 01 වැනි සිකුරාදා - 2016.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**උතුරු පළාතේ පළාත් සභාව**

උතුරු පළාත් අධ්‍යාපන ප්‍රඥප්තිය අංක 02/2015

උතුරු පළාතේ පළාත් සභාව විසින් 2015 වසරේ දෙසැම්බර් මස 30 වැනි දින අනුමත කරන ලද 2015 වසරේ අංක 02 දරන උතුරු පළාත් අධ්‍යාපන ප්‍රඥප්තියට උතුරු පළාත් ගරු ආණ්ඩුකාරවරයා විසින් 2016 වසරේ පෙබරවාරි මස 08 වැනි දින සම්මුතිය ලබාදී ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. තෙයිවේන්ත්‍රිම්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

2016 මාර්තු මස 30 වැනි දින,
සභා ලේකම් කාර්යාලය,
A9 පාර,
කයිතඩි.

**උතුරු පළාත් සභාව**

**උතුරු පළාත් සභාවේ 2015 වර්ෂයේ අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය**

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ නම වැනි උප ලේඛනයේ 1 වැනි ලැයිස්තුවේ විෂයයන් 3 සහ ඇමුණුම් 111 හි සඳහන් පරිදි ක්‍රියාකාරකම් වෙන් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන සැළසීම සඳහා වූ ප්‍රඥප්තියකි. කාලයෙන් කාලයට සංශෝධන සහිතව අධ්‍යාපන ආඥාපනත (381 වැනි පරිච්ඡේදයේ) සමග මෙම ප්‍රඥප්තිය අනුකුලවේ.

ශ්‍රී ලංකා ප්‍රජාත්‍රන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු පළාතේ, පළාත් සභාව විසින් පහත දැක්වෙන පරිදි නීති සම්පාදනය කරනු ලැබේ.


1A - PG 2910 — 26 (2016/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය

(1) මෙම ප්‍රඥප්තිය උතුරු පළාතේ, පළාත් සභාවේ 2015 අංක 02 දරන අධ්‍යාපන ප්‍රඥප්තිය ලෙස හඳුන්වනු ලබන අතර, ආණ්ඩුකාරවරයාගේ එකඟතාවය ලැබෙන දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

උතුරු පළාතේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම

(2) (i) මෙම ප්‍රඥප්තියේ අරමුණු ඉටුකරගැනීම සඳහා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ, සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ සහ කාලයෙන් කාලයට පත්කරනු ලබන අනෙකුත් නිලධාරීන් සහ සේවකයන් සහිත පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ස්ථාපිත කළ යුතු ය.

(ii) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයට පෙර ක්‍රියාත්මක වූ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරන ලද බවටත්, එලෙසම ඒවා ක්‍රියාත්මක වන බවටත්, එම දෙපාර්තමේන්තුවේ එක් එක් කාර්යාලයෙන් සහ නිලධාරීන් මෙම ප්‍රඥප්තිය යටතේ පත්කරන ලද බවත් එලෙසම අඛණ්ඩව තනතුරු තිබෙන බවත්, සැළකිය යුතු ය.

(3) (i) අධ්‍යාපන අමාත්‍යවරයාගේ සාමාන්‍ය නියෝගයන් සහ පාලනයන්ට යටත්ව මෙම ප්‍රඥප්තිය සහ ඒ යටතේ සම්පාදනය කරනු ලබන රීති අධ්‍යක්ෂවරුන් සහ අනෙකුත් නිලධාරීනුත්, ඉටුකළයුතු අතර, ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා බලතල තිබිය යුතු ය.

(ii) මෙම ප්‍රඥප්තිය සහ ඒ යටතේ සම්පාදනය කරනු ලබන රීති කුමණ විධිවිධානයක් යටතේ හෝ අධ්‍යක්ෂවරුන් තම අභිමතය අනුව ක්‍රියාත්මක කර නිකුත් කරන නියෝග හෝ තීරණවලට අභියාචනා කිරීම හෝ වෙනත් ආකාරයකින් ප්‍රතික්ෂේප කිරීම හෝ වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම නිවැරදි කිරීමේ අයිතිය නීත්‍යානුකූලව අමාත්‍යවරයාට තිබේ. අමාත්‍යවරයාගේ මෙම තීරණය අවසානාත්මක වේ.

1 කොටස

**උතුරු පළාතේ කලාප අධ්‍යාපන උපදේශක සභා සහ පාසැල් උපදේශක සභා ස්ථාපිත කිරීම**

කලාප අධ්‍යාපන උපදේශක සභා

(4) (i) කලාපවල අධ්‍යාපනයට සම්බන්ධ විෂයයන් සහ ඒ පිළිබඳව පැනනගින අවශ්‍යතාවයන් සහ ඒ පිළිබඳව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට උපදෙස් ලබාදීම සඳහා කලාප උපදේශක සභා අමාත්‍යවරයාට ස්ථාපිත කළ හැකි ය.

(ii) එක් එක් කලාප උපදේශක සභාවක් සඳහා පහත දැක්වෙන තැනැත්තන් සාමාජිකත්වය දරන්නේ ය.

*අ.* අදාළ කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා

*ආ.* අදාළ කලාප අධ්‍යාපන බල ප්‍රදේශයේ තිබෙන පළාත් පාලන ආයතනවලින් එක් අයෙකු බැගින් සුදුසුකම්ලත් සහ යෝග්‍ය නියෝජිතයෙක්

*ඇ.* කලාපය පිහිටි කොට්ඨාසයේ පදිංචි පළාත් සභා මන්ත්‍රීවරයෙක්

*ඈ.* කලාප අධ්‍යාපන කොට්ඨාසයේ සිටින සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී

*ඉ.* පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන අදාළ කලාපයට අයත් වර්ග හතරකට අයත් පාසැල්වල සේවය කරනු ලබන විදුහල්පතිවරුන් හතර දෙනෙකු

*ඊ.* කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් නම් කරනු ලබන කලාපයට අයත් පාසැල් අතුරෙන් පස්දෙනෙකුට නොවැඩි ශිෂ්‍ය නායකයන්

(iii) කලාපයේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා, කලාප අධ්‍යාපන උපදේශක සභාවේ සභාපතිවරයා වශයෙන් කටයුතු කරනු ලබන්නේ ය.

(iv) උපදේශක සභාවේ පළමුවැනි සභාවාරයේදී එහි සාමාජිකයන් අතුරෙන් ලේකම්වරයෙකු පත්කරගත යුතු ය.

(v) කලාප උපදේශක සභාවෙ අවධානයට යොමුවන අධ්‍යාපනයට සම්බන්ධ සියලු කරුණු නියමිත කාලයක්තුළ දී නියමිත පරිදි රැස්වන කලාප අධ්‍යාපන උපදේශක සභා රැස්වීම්වල දී අධ්‍යනය කර විසඳුම් ලබාදය යුතු ය.

(vi) මෙම ප්‍රඥප්තිය යටතේ ස්ථාපිත කරනු ලබන කලාප අධ්‍යාපන උපදේශක සභාවලට කුමණ අයුරකින් හෝ විධායක, පරිපාලන රාජකාරි හෝ බලතල ලබාදී ඇති බව අදහස් නොකරන අතර ඒ ඒ උපදේශක සභාවට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ හෝ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් බලතල ලබාදෙන රීති මෙම ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කළ හැකි ය.

පාසැල් උපදේශක සභා

(5) (i) මධ්‍යම රජයේ අමාත්‍යාංශය විසින් නිශ්චය කරන ලද නීති රීතිවලට අනුකූලව පළාතේ ඇති සෑම පාසැලකම පාසැල් උපදේශක සභා තිබිය යුතු ය.

(ii) පාසැල් උපදේශක සභාවන්වල කාර්ය වනුයේ පාසැල්වල ක්‍රියාකාරකම් පාලනය කිරීම, විධිවිධාන සැළසීම, වැඩසටහන් පැවැත්වීම සම්බන්ධයෙන් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා විසින් යෝජනා කරනු ලබන විෂයන් හෝ උපදෙස් ලබාදීම හෝ යෝග්‍ය වන අතර උපදේශක සභාව අනුමත කරන විෂයන් සම්බන්ධයෙන් පාසැලේ පරිපාලනයට උපදෙස් ලබාදිය හැකි අයුරින් තිබිය යුතු ය.

(iii) පාසැල් උපදේශක සභාවලට කුමණ අරමුණක් සඳහා හෝ කුමණ හෝ පරිපාලන හෝ විධායක බලතල හෝ ක්‍රියාකාරකම් ලබාදී ඇති බව අදහස් නොකළ යුතු ය.

(iv) පාසැල් උපදේශක සභාවට විදුහල්පති, ගුරුවරුන් සහ සිසුන්ගේ දෙමාපියන් හෝ භාරකරුවන් සාමාජිකයන් වශයෙන් සිටිය යුතු ය.

(v) පාසැල් උපදේශක සභාවේ සභාපති වශයෙන් පාසැලේ විදුහල්පතිවරයා කටයුතු කරන්නේ ය.

(vi) පාසැල් උපදේශක සභාව ස්ථාපිත කළ පසුව පැවැත්වෙන පළමු රැස්වීමේ දී සාමාජිකයන් තමන් අතුරෙන් කාරක සභාවක් තෝරාපත් කර ගත යුතු ය.

පොදු කොන්දේසි

(6) කිසිදු ශිෂ්‍යයෙකුට හෝ ඔහුගේ දෙමාපියන්ගේ ආගම, ජාතිකත්වය, ජාතිය, කුලය, සමාජ දැනුම, ආබාධිත තත්ත්වය හෝ භාෂාව හේතුකොට ගෙන පළාතේ කුමණ හෝ පාසැලකට ඇතුල්වීම නොවැළැක්විය යුතු ය.

(7) (i) පළාත් අමාත්‍යාංශයේ බලතල පහත සඳහන් කුමණ පාසැලක හෝ ඇතුළත් කර ගැනීම සඳහා ගාස්තු කිසිවක් අය නොකළ යුතු ය.

(ii) උප වගන්තිවල කුමක් සඳහන් වුවද, කුමණ පාසැලක හෝ ක්‍රීඩා සඳහා ශාරීරික අභ්‍යාස හෝ අධ්‍යාපන, විනෝදාංශ හෝ සෞඛ්‍ය අරමුණු සඳහා පහසුකම් සැළසීම සඳහාවූ වියදම් පියවීම සඳහා සිසුන්ගෙන් ගාස්තු අයකිරීමට බලතල ලබාදෙන රීති මෙම ප්‍රඥප්තිය යටතේ සම්පාදනය කළ හැකි ය.

(8) එක් පාසැලක ගොඩනැගිළි, ගුරු නිවාස, කාර්යාල හෝ සංකීර්ණ හෝ පාසැල් ගෙවතු හෝ ක්‍රීඩාගාර ඉදිකිරීම, ව්‍යාප්ත කිරීම යනාදිය හෝ ඒවා පිළිබඳ අරමුණු සඳහා හෝ මෙම ප්‍රඥප්තියේ අරමුණු වෙනුවෙන් අවශ්‍ය වන්නාවූ ඕනෑම පෞද්ගලික ඉඩම් දැනට බලපවත්නා ලිඛිත නීතිවල සඳහන් විධිවිධානවලට අනුකූලව අත්පත් කර ගත හැකි ය.

(9) අමාත්‍යවරයා හෝ අධ්‍යක්ෂවරයා හෝ අමාත්‍යාංශයේ හෝ දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරනු ලබන නිලධාරියා හෝ සාමාන්‍ය හෝ විශේෂයෙන් අමාත්‍යවරයා විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් බලතල පවරණ වෙනත් අයෙකු කුමණ හෝ පාසැලකට ප්‍රවේශ වී එම ස්ථානයෙන් කරනු ලබන ක්‍රියාකාරකම් හෝ එහි තිබෙන පොදු දේපළ අධීක්ෂණය කිරීම නීත්‍යාණුකුල වේ.

## 11 කොටස

## රීති සම්පාදනය සඳහා අමාත්‍යවරයා සතු බලතල

රීති සම්පාදනය සඳහා අමාත්‍යවරයා සතු බලතල

(10) (i) මෙම ප්‍රඥප්ති, ප්‍රතිපත්ති සහ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ අරමුණෙන් අමාත්‍යවරයා විසින් රීති පැනවිය හැකි ය. ඒවා කාරක නියෝග ගොණුව වශයෙන් හඳුන්වනු ලැබේ.

(ii) විශේෂයෙන් පහත සඳහන් විෂයන්ට අදාළ රීති අමාත්‍යවරයා විසින් පැනවිය හැකි ය.

අ. 1. පළාතේ තිබෙන පලාත් පාසැල්වලට එසේත් නැතිනම් නිශ්චය කරන ලද ජාතික පාසැල් සන්නද්ධ හමුදාවන් සඳහා ස්ථාපිත කර ඇති විශේෂ පාසැල් හැර අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති සඳහා පහසුකම් සැළසීම.

2. (අ) සියලුම පෙර පාසැල් ද

(ආ) ඉහත (11) අ සහ (1) හි සඳහන් පාසැල් හැර අනෙකුත් සියලුම පාසැල් කළමනාකරණය කිරීම, අධීක්ෂණය කිරීම,

3. අධ්‍යාපන විද්‍යාපීඨත්, විශ්වවිද්‍යාලත්, ඩිප්ලෝමා සහ උපාධිධාරීන් අතුරෙන් ඉගැන්වීමට සුදුසුකම් ඇති තැනැත්තන් ඉගැන්වීම සඳහා බඳවා ගැනීම් සිදුකිරීම.

4. ජාතික අධ්‍යාපන අමාත්‍යවරයා විසින් තීර්ණය කර ඇති IAB සහ IC පාසැල් හැර පළාතේ පිහිටි සියලුම පාසැල්වලට විදුහල්පතිවරුන් පත් කිරීම.

5. සියලුම අධ්‍යාපන කේෂත්‍රයේ කාර්ය මණ්ඩලයටත් විදුහල්පතිවරුන් සහ අධ්‍යාපන නිලධාරීන් යන අයගේ ස්ථානමාරු සහ විනය පරීක්ෂණ පාලනය කිරීම දීප ව්‍යාප්ත සේවයේ නියුතු ජාතික සේවයේ නියුතු නිලධාරීන්ට රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමේ හිමිකම් ඇත. පළාත් රාජ්‍ය සේවයට අදාළ නිලධාරීන්ට සේවයෙන් පහකිරීමට එරෙහිව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට අභියාචනා කිරීමේ හිමිකම් ඇත.

6. පළාත් මට්ටමින් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති වාර්ෂිකව ක්‍රියාත්මක කිරීම පිළිබඳව වැඩසටහන් පිළියෙල කිරීම.

7. වාර්ෂික අධ්‍යාපන සැළැස්ම ක්‍රියාත්මක කිරීම

8. විදුහල්පතිවරුන් ගුරුවරුන් සහ අනෙකුත් අධ්‍යාපන කේෂත්‍රයේ කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාවය ඇගයීම

9. ජාතික අධ්‍යාපන මධ්‍යස්ථානයේ පූර්ව අනුමැතිය සහිතව සේවාස්ථ පුහුණු පැවැත්වීම

10. විභාග කොමසාරිස් විසින් අනුමත කරන ලද දේශීය විභාග පැවැත්වීම

11. විධිමත් අධ්‍යාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

12. පෙර පාසැල් ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම

13. ප්‍රථමික විෂය නිර්දේශත්, ද්විතීය විෂය නිර්දේශයත් තෝරා ගන්නා ලද විෂයයන්ගෙන් දේශීයව සංශෝධනය කිරීමට ජාතික අධ්‍යාපන ආයතනයේ අනුමැතිය ලබා ගැනීම

14. අධ්‍යාපන ගොඩනැගිලි, පුස්තකාල සහ ක්‍රීඩාංගන ඉදිකිරීම සහ නඩත්තු කිරීම

15. ඉගැන්වීමේ සහායක උපකරණ සහ ඉගෙන ගැනීමේ සහායක උපකරණ සහ ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ, ලීබඩු උපකරණ මිළදී ගැනීම සහ බෙදාහැරීම

16. මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නිශ්චය කරන ලද දෑ හැර අනෙකුත් විද්‍යා උපකරණ මිළදීගෙන ලබාදීම

17. පිරිසිදු පානීය ජලය ප්‍රමාණවත් පරිදි ලබාදීම

18. ජාතික රජයේ අධ්‍යාපන අමාත්‍යාංයේ අනුමැතියෙන් පසුව පාසැල් පෙළපොත් සකස්කර බෙදාහැරීම

19. ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ මගපෙන්වීම අනුව පාසැල් පුස්තකාල ප්‍රතිෂ්ඨාපනය කර සංවර්ධනය කිරීම

20. පළාත තුළ තිබෙන ප්‍රාදේශීය අධ්‍යාපන කාර්යාලයකම බල ප්‍රදේශ තීරණය කිරීම

21. නොමිළයේ ආහාර සහ නිල ඇඳුම් සහ නොමිළයේ පෙළ පොත් පාසැල් සිසුන්ට ලබාදීම, ඇතුළුව දරුවන්ගේ සෞඛ්‍ය පරීක්ෂාවන්, සායනයන් සෞඛ්‍ය සහ සුභ සාධනය යනාදිය ඉටුකිරීම

22. ජාතික අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති නියමයන් වර්ග කිරීමේ පදනමින් පළාතේ පාසැල් ස්ථාපිත කිරීම, තත්ත්වය උසස් කිරීම, වර්ග කිරීම ආදිය ඉටු කිරීම

23. පළාතේ වර්ධනය වන වැඩිහිටි අධ්‍යාපන අවශ්‍යතා පිළිබඳව වැඩසටහන් ඇතිකර ක්‍රියාත්මක කිරීම

24. පළාත් අයවැය සකස් කිරීම සහ අධ්‍යාපන අවශ්‍යතා නැංවීමේ අරමුණ සහිතව පළාත් අරමුදල් කළමනාකරණය කිරීම සහතික කිරීම

25. ''111 වැනි උප වගන්තියේ අධ්‍යාපන'' හි සඳහන් අදාළ රීති සම්පාදනය කිරීම අවශ්‍ය යැයි අමාත්‍යවරයා අදහස් කරන වෙනත් කුමණ හෝ වැදගත් විෂයන් (111) මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන කුමණ හෝ රීතියක්ම පළාත් සභාවෙන් අනුමැතිය ලබාගැනීමෙන් පසුව ක්‍රියාත්මක වේ.

භාෂා අතර නොගැළපීම (11) මෙම ප්‍රඥප්තියේ දෙමළ භාෂා තේරුමත් සිංහල භාෂාව හෝ ඉංග්‍රීසි භාෂා අතර කුමණ හෝ අසමානතාවයක් පැන නැගුනහොත් දෙමළ භාෂා පාඨය බලපැවැත්වේ.

අර්ථ නිරූපණය (12) මෙම ප්‍රඥප්තියේ අන් ආකාරයකින් සඳහන් වුවහොත් හැර,

''ආණ්ඩුකාරවරයා'' යනු උතුරු පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස අදහස් කෙරේ

''පළාත් සභාව'' යනු උතුරු පළාත් සභාව අදහස් කෙරේ

''පළාත'' යනු උතුරු පළාත අදහස් කෙරේ

''අමාත්‍යවරයා'' යනු උතුරු පළාත් අමාත්‍ය මණ්ඩලයේ අධ්‍යාපන විෂය භාරව සිටින අමාත්‍යවරයා අදහස් කෙරේ

''අධ්‍යක්ෂ'' යනු උතුරු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ අධ්‍යාපන අධ්‍යක්ෂවරයා අදහස් කෙරේ

කේ. තෙයිවේන්ත්‍රිම්,
ලේකම්,
සභා ලේකම් කාර්යාලය,
උතුරු පළාත් සභාව.

04 - 738

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.